තිල් කබාය
සහ
මායාකාර රජ

සෝවියට් ජනකතා

නිල් කබායි සහ මායාකාර රෝස

බෙලොරුසියානු ජනකතාවකි

අනුවාදය: ද.වී. රුද්රිගු

චිත්‍ර: වී. මිලාෂෙවිස්කි

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

මොස්කව්



එකෝමත් එක රටක මායාකාර රජ කෙනෙක් රජකම් කළා. දවසක් ඌ ඔහු රටවැසියන්ට මෙහෙම අණකළා:

මට නොපෙනෙන්ට හැංගෙන්ට පුළුවන් කාටද, ඔහුට මම රටෙන් බාගයක් දෙනවා!''

රජ්ජුරුවන් සමග හැංගි මුත්තන් කෙළින්ට දඩයක්කාරයෙක් කැමති වුණා. මේ දඩයක්කාරයා නිල් කබායක් ඇඳගෙන හිටියා. ඔහු මායාකාර රජ ළඟට ඇවිත් මෙහෙම කිව්වා:

''රජ තුමනි! ඔබ වහන්සේට හොයාගන්ට බැරිවන විදිහට හැංගෙන්නට මට පිළිවනි.''

''හොඳයි. නුඹ දිනුවොත් මම නුඹට රටෙන් බාගයක් තෑගි දෙනවා. නුඹ පැරදුනොත් මම නුඹේ හිස කපා දමනවා'' කියලා රජ කිවා.

නිල්කබා කාරයා එකහවුණා. දඩයක්කාර නිල්කබා කාරයාත් ඉන්ද්‍ර ජාලම් දන්නවා. ඔහු රජතුමා ඉදිරියේ තරුණයෙක් වගේ පෙනී හිටියා. රජ මාලිගය දිගේ කලුපාට මුගටියෙක් වගේ දිවගියා. රජ වාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. පිටිටනිය හරහා දුවලා ගියේ හාවකුගේ වෙස් අරගෙනයි.

ඔහොම දුවලා, දුවලා ගිහින් තිස්නව වැනි රටට ආවා. ඒ රටේ තියෙනවා මහ විසාල පොකුණක්.

ඔය පොකුණේ මල් තුනක වෙස් අරගෙන නිල්කබා කාරයා සැඟවුණා.

පසු ද උදේ රජ්ජුරුවෝ එයාගේ මන්තර පොත අරගෙන නිල්කබාකාරයා හැංගිලා ඉන්න තැන හොයා බැලුවා.

''මා ඉදිරිපිට නිල් කබාකාරයා තරුණයෙකු වගේ පෙනී හිටියා. රජ මාලිගය දිගේ කලුපාට මුගටියෙකු වගේ දිව්වා. රජ වාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. හාවකුගේ වෙස් අරගෙන පිටිටනිය හරහා දිව්වා. තිස් නව වැනි රටට ගිහිල්ලා, ඒ රටේ පොකුණක මල් තුනක වෙස් අරගෙන හැංගිලා ඉන්නවා.''

රජ සේවකයින්ට අඬ ගැසුවා.

තිස් නව වැනි රටට ගිහිල්ලා ඒ රටේ පොකුණේ ඇති මල් තුන කඩාගෙන එන ලෙස ඔවුන්ට අණ කළා.

රාජ සේවකයෝ ගියා.

බොහොම දුර ගිහිල්ලා, ගිහිල්ලා, තිස්නව වැනි රටට ඇවිත්, ඒ රටේ පොකුණේ ඇති මල්තුන කඩාගෙන ලේන්සුවක ඔතාගෙන ගිහිල්ලා රජතුමාට බාර දුන්නා.

රජ ලේන්සුව දිගහැර මල් තුන අතට අරගෙන හිනාවුණා:

''ආ, කොහොමද නිල් කබාකාරයා! නුඹ පරාදවුණා නේද?'' රජ ඇසුවා.

නිල් කබා කාරයා මිනිහකුගේ වෙස් ගත්තා:

''රජ තුමනි, මට ආයෙමත් වරක් හැංගෙන්ට අවසර දෙන්න.'' ඔහු ඉල්ලා හිටියා.

රජ අවසර දුන්නා.

නිල් කබාකාරයා රජ ඉදිරිපිට තරුණයකු වගේ පෙනී හිටියා. රජ මාලිගය දිගේ කලු මුගටියකු වගේ දිව්වා. රජ වාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. හාවකුගේ වෙස් අරගෙන පිට්ටනිය හරහා දිව්වා.

ගව් දහක් දුර දුවලා, දුවලා ගිහිල්ලා එක රටකට ඇතුළු වුණා.

ඒ රටේ විශාල ගස් ජාතියක් තියෙනවා. ඒවායට විලක්.

නිල් කබාකාරයා ඔය විලට රිංගලා මාළුවකුගේ වෙස් ගත්තා. විලේ පතුලට වෙලා සැඟවුණා.

පසුදා උදේ රජ මන්තර පොත දිගහැර බැලුවා. පොත බලාගෙන රජ මෙහෙම කිව්වා:

''නිල් කබාකාරයා මා ඉදිරිපිට තරුණයකු වගේ පෙනී හිටියා. රාජමාලිගය දිගේ කලු මුගටියකු වගේ දිව්වා. රජවාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. හාවකුගේ වෙස් අරගෙන පිට්ටනිය හරහා දුවලා ගියා. ගව් දහක් දුර දුවලා ගිහින් එක රටක විලකට ඇතුළු වෙලා මාළුවකුගේ වෙස් අරගෙන හැංගිලා ඉන්නවා.''

ගව්දහක් දුරැති රටට ගිහිල්ලා විල ඉහලා මාළුවා අල්ලා ගෙන එන ලෙස රජ සේවකයින්ට අණ කළා.

සේවකයෝ රජ අණ ඉටු කළා.

විලේ වතුර ඉහලා දැම්මා.

විල පතුලේ හැංගිලා හිටිය මාළුවා අල්ලා ගත්තා.



රජ මාළුවා දිහා බලා මෙහෙම කිව්වා:

''ඒයි නිල්කබොකාරයා තුඹ ආයෙමත් පැරදුනා නේද?'' රජ හිනා වුණා.

නිල් කබොකාරයා මිනිහකුගේ වෙස් අරගෙන රජ ඉදිරියේ පෙනී හිටියා:

''මහ රජතුමනි! තව වරක් හැංගෙන්ට අවසර දෙන්න.''

රජ අවසර දුන්නා.

නිල් කබොකාරයා රජ ඉදිරියේ තරුණයකු වගේ පෙනී හිටියා. රාජ මාලිගය දිගේ කලු මුගටියකු වගේ දිව්වා. රජවාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. හාවකුගේ වෙස් අරගෙන පිට්ටනිය හරහා දුවලා ගියා.

ඔහොම දුවලා, දුවලා ගිහින් විසාල ඕක් ගස් වැවෙන රටකට ඇතුළු වුණා. මේ රටේ එක ඕක් ගසක මුදුන අහසට වැදෙන තරම් උසයි.

නිල් කබාකාරයා ඕක් ගහට ඇතුළු වුණා.

ගස් කටුවක වෙස් ගත් නිල් කබා කාරයා ඕක් ගහේ පොත්තක් යට සැඟවුණා.

මේ වේලාවේදී නගායි වර්ගයට අයත් මොනරෙක් පියාඹා ඇවිත් ඕක් ගහේ අත්තක් උඩ වැහැව්වා.

ගහේ පොත්තක් යට මිනිහෙක් හැංගිලා ඉන්න බව මොනරාට දැනුණා.

''හැංගිලා ඉන්නේ කවුද?'' මොනරා ඇසුවා.

''මම'' නිල් කබාකාරයා කිව්වා.

''නුඹ මෙතැනට ආවේ කොහොමද?''

''මායාකාර රජාට අහු නොවෙන්ට හැංගෙන්නට කොහොමවත් බැහැ''

''නුඹව හංගන්නට මට පුළුවනි. නුඹ කැමැතිද?'' මොනරා ඇහුවා.

''අනේ මොනරාතෙනි! මාව හංගන්නට. ජීවිතය තිබෙන තුරු මම නුඹව අමතක කරන්නේ නෑහැ.''

මොනරා නිල් කබාකාරයාව මොනර පිහාටුවක් බවට පත් කළා. ඌ මේ මොනර පිහාටුව අරගෙන මායාකර රජුගේ මාලිගයට පියාඹා ගිහිල්ලා, රජුගේ රාජකීය කමිසයට යටින් එය තැබුවා. නිදහිටි රජුට එය දැනුනේ නැහැ.

රජ උදේ නැගිට දත් මැද, මුණ සෝදා මන්තර පොත බැලුවා.

නිල් කබාකාරයා මා ඉදිරිපිට තරුණයකු වගේ පෙනී හිටියා. රාජ මාලිගය දිගේ කලු මුගටියකුගේ වෙස් අරගෙන දුවලා ගියා. රජ වාසල ළඟදී සුදු මුගටියකුගේ වෙස් ගත්තා. භාවකුගේ වෙස් අරගෙන පිටිටනිය හරහා දුවලා ගියා. අහස තරම් උස ඕක් ගහක් ඇතුළට රිංගලා ගස් කටුවක වෙස් අරගෙන නිල්කබා කාරයා හැංගිලා ඉන්නවා.'' රජ කිව්වා.

ඒ ඕක් ගහ මුලින් උදුරලා ගින්නට දමා පුළුස්සන ලෙස රජ අණ කළා.

සේවකයෝ රජ අණ ඉටුකළා, නමුත් නිල්කබා කාරයා හොයාගන්ට ඔවුන්ට බැරිවුණා.

''මහ රජතුමනි! නිල්කබාකාරයා අපට අහුවුණේ නැහැ!'' සේවකයෝ කිව්වා.

''එහෙම කොහොමද? වෙන්ට බැරි වැඩක්!'' රජ කෝපවුණා.

''ඔහු එතන නැහැ!'' සේවකයෝ නැවතත් කිවා.

රජු මාලිගා වත්තට ඇවිත් සැඟවී හිටිය දඩයක්කාරයාට කතා කළා:

''නිල් කබාකාරයා මා ළඟට වරෙන්!''

''රජ තුමනි! ඔබවහන්සේගේ සෙනවි වරුන් රැස්කරන්න. එවිට මම පෙනී හිටින්නම්.'' නිල් කබාකාරයා කීවා.

නිල් කබාකාරයාගේ කටහඬ ඇහෙනවා, නමුත් ඔහු සැඟවී සිටින තැන රජ දන්නේ නැහැ.

රජ හැරී, හැරී වට පිට බැලුවා. නිල් කබාකාරයා පෙනෙන්ට හිටියේ නැහැ. රජුට කළ හැකි දෙයක් නැහැ.

රජ සෙනවිවරුන් රැස්කරවා නැවත වරක් ඔහුට අඩ ගැසුවා:

''නිල්කබා කාරයා මා ළඟට වරෙන්!''

''එහෙම බැහැ! සෙනවිවරුන් ඉදිරි පිටදී මට ඔබ වහන්සේගේ රටින් බාගයක් දෙන බවට ලියවිල්ලක් අත්සන් කරන්න. එවිට මම පෙනී හිටින්නම් නැතිනම් ඔබ වහන්සේ මාව රවටාවි! මම ඔබ වහන්සේගේ හැටි දන්නවා.''

තම රටින් බාගයක් දෙන්න රජ කැමති වුණේ නැහැ. එහෙත් රජුට නොදී ඉන්ට බැරිවුණා. නිල් කබාකාරයාට රටින් බාගයක් දෙන බව සහතික කරන

ලියවිල්ලකට රජ අත්සන් තැබුවා. එවිට රජුගේ කමිසය අස්සේ සැඟවී සිටි නිල්කබාකාරයා තරුණයකුගේ වෙස් ගෙන රජ ඉදිරියේ පෙනී හිටියා.

''රජ තුමනි! මෙන්න මම'' නිල් කබා කාරයා ලියවිල්ල අරගෙන තම සාක්කුව තුළ දමා ගත්තා.

එද සිට මායාකාර රජ හැංගිමුත්තන් කෙළීමට රට වැසියන්ට අඩගැසීම නැවැත්වුවා.

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශන මන්දිරය, මොස්කව්

Синяя свита наизнанку сшита

Белорусская сказка

на сингальском языке

4803000000

870-81